**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කටුපොත දෙමහල් වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු.133,440 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයට අදාළ රු.53,750ක් වූ බැංකු පොලී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | රු.1,600,000ක් වූ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි CCTV කැමරා පද්ධතියෙහි වටිනාකම ගිණුම්ගත කර නොතිබූ අතර වටිනාකම රු.10,000 ක් වූ ඉඩමක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයිතමයන් 07 කට අදාළව මූල්‍ය ප්‍රකාශන වටිනාකම් හා අදාළ උපලේඛනවල වටිනාකම් අතර රු.228,395,229 වෙනසක් විය. | 2023 දෙසැම්බර් 31 දිනට නිවැරදි උපලේඛනය සකස් කර ඉදිරිපත් කරන බව. | නිවැරදි ශේෂ ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 570 හා 571 | වටිනාකම රු.759,878 ක් වූ ඉකුත් වූ තැන්පතු 145 ක් නියාදනය කර නොතිබුණි. | තැන්පත් ශේෂයන් නිදහස් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.63,416,759 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.44,280,502 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ කිහිපයක සිට පැවත එන රු.52,752 ක් වූ අහරු චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ කිහිපයක සිට පැවත එන රු.52,752ක් වූ අහරු චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 391 ප්‍රකාරව කඩිනමින් කටයුතු කරන බව. | අදාළ ශේෂ කඩිනමින් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. |
| (i) | වරිපනම් හා බදු | 3,609 | 3,851 | 3,797 | 888 | 2,605 | 2,450 | 2,450 | 832 |
| (ii) | කුලී | 10,984 | 10,537 | 10,556 | 5 | 973 | 8,986 | 8,986 | 1,663 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,160 | 1,065 | 1,065 | 0 | 803 | 803 | 803 | 0 |
| (iv) | වෙනත් ආදායම් | 15,669 | 19,100 | 17,867 | 329 | 443,398 | 443,398 | 439,692 | 266,023 |
| | | 31,422 | 34,553 | 33,285 | 1,222 | 447,779 | 455,637 | 451,931 | 268,518 |

#### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වරිපනම් ශේෂය වසර 1-5ක් අතර කාලයට අදාළ රු.381,960ක් හා වසර 5ට වැඩි රු.98,032ක ශේෂයක් වී තිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) **අක්කර බදු**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 05කට වඩා පැරණි රු.278,989ක අක්කර බදු ශේෂයක් විය. | අක්කර බදු අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

(ඇ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.12,199,963ක් හා මුද්දර ගාස්තු රු.125,144,362ක් විය. | මුද්දර ගාස්තු ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ කඩිනමින් ගෙන්වාගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03ක වටිනාකම රු.70,255,161ක් වූ අතර එම ශේෂ තුළ වසර 1-5ත් අතර කාලයකට අදාළ රු.69,878,140ක් හා වසර 5කට වඩා පැරණි රු.377,021ක ශේෂයක් අය නොවී පැවතුණි. | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී නිරවුල් කිරීමටත් කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 10ක එකතු වටිනාකම රු.6,649,575ක් වූ අතර වසර 1ත් 5ත් අතර කාලයට අදාලව ආපසු ගෙවිය යුතු තැන්පත් හා ගෙවිය යුතු ශේෂ රු.6,096,729ක් හා කලින් ලැබීම් රු.453,663ක් විය. වසර 5කට වඩා පැරණි ආපසු ගෙවිය යුතු තැන්පත් අයිතම 7කට අදාළ එකතු වටිනාකම රු.99,184ක් විය. | -එම- | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව සතු මාළු ලැල්ල, ආපන ශාලාව හා බදු දිය හැකි එළදා ඉඩම් 17ක් සමාලෝචිත වර්ෂය තුළ බදු දීමට කටයුතු කර නොතිබුණි. | එම වත්කම් බදු ලබාදීමට ටෙන්ඩර්පත් කැඳවූ නමුත් කිසිවෙකුත් ඉදිරිපත් නොවීම මත එම වත්කම් බදු ලබාදීමට නොහැකි වී ඇති බව. | බදුදිය හැකි වත්කම්වලින් ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු සුසාන භූමි 107ක් පවරා ගැනීම සඳහා කටයුතු ඉටුකර නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි ස්ථාවර වත්කම් ලේඛනය සහ වීදි පහන් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර යන්ත්‍ර උපකරණ, ලී බඩු හා උපකරණ , මෝටර් රථ හා කරත්ත වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. | වත්කම් පිළිබඳ පූර්ණ සමීක්ෂණයකින් අනතුරුව ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | සියළුම වත්කම් ලේඛන ගතකර යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ඇ) | සභාව සතු ඉඩම් පිළිබඳ විධිමත් පරිදි සමීක්ෂණ සිදුකර නොතිබුණු අතර සභාව සතු වීදි පහන් කනු සියල්ල නිසි පරිදි අංකනය කර නොතිබුණි. | සමීක්ෂණ කටයුතු 2023 අගෝස්තු මස අවසන් වන විට සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇති බව. | වත්කම්වල ආරක්ෂාව ප්‍රමාණවත් පරිදි තහවුරු කළ යුතුය. |

## 3.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතුව නළ ළිං 69ක් පැවති අතර ඉන් 15ක් පමණ අක්‍රීය මට්ටමේ පැවතුණි. | සභාවට අයත් නල ළිං 15 ක් අක්‍රීය වීමට හේතු වී ඇත්තේ ගස්වල මුල් මගින් ඇතුලත වැසීයාම නිසා බව. | වත්කම් උපරිම ලෙස උපයෝජනය කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු.1,000,000 ක ප්‍රතිපාදනය යටතේ ආරම්භ කිරීමට තිබූ ව්‍යාපෘති 2 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.535,806 ක් ගෙවීම් කර තිබුණ ද වැඩ ආරම්භ කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස් හා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් පසු ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව. | ඇස්තමේන්තු කළ ව්‍යාපෘති නියමිත කාල සීමාව තුළ නිම කළ යුතුය. |

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 04ක ඇස්තමේන්තුගත සහ සත්‍ය ආදායම් අතර සියයට 18 සිට 69 දක්වා විචලනයක් ද වියදම් විෂයයන් 21 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 30කට වඩා විචලතාවයක් ද නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | මුදල් අමාත්‍යාංශය මගින් 2022 අප්‍රේල් 26 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 යටතේ රාජ්‍ය වියදම් පාලනය කිරීමට සිදුවීම මත සැලසුම්කල කර්මාන්ත හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගත යුතුය. |